*සැ. යු.*– මෙවර ගැසට් පත්‍රයේ V කොටසේ 2000 වර්ෂයේ මුද්‍රිත පොත් නාමවලියේ අප්‍රේල්-ජුනි කාර්තුව ඉංග්‍රීසි භාෂාවෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,470 - 2006 නොවැම්බර් 03 වැනි සිකුරාදා - 2006.11.03**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... .. | 928 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 928 | මිළ පාලන දැන්වීම් .. ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 930 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — | නැවියන්ට දැන්වීම් .. ... | — |
| | | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


*සැ. යු.*–(i) සමෝදා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2006 ඔක්තෝබර් මස 05 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) විසර්ජන පනත් කෙටුම්පත 2006 සැප්තැම්බර් මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) ලංකා විදුලිබල මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත 2006 ඔක්තෝබර් මස 13 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 නොවැම්බර් මස 10 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 ඔක්තෝබර් මස 27 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2006 අංක 326

### ජාතික ශිෂ්‍ය භට බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

පහත නම් සඳහන් මහත්ම මහත්මීන් 2005 අගෝස්තු මස 25 වැනි දින සිට දක්වා ඇති ජ්‍යෙෂ්ඨත්වයට අනුව ජාතික ශිෂ්‍යභට බලකායේ දෙවන ලුතිනන් වරුන් වශයෙන් අධිකාරියට පත් කිරීමට අතිගරු ජනාධිපතිතුමන් විසින් ප්‍රසාදය පළ කර ඇත.

මද්දගේ ජගත් විමලසිරි මහතා
රාජපක්ෂ වෛද්‍යාලංකාර රත්නාධිපති ගණිතගෙදර ජනක සාන්ත මහතා
ජයලත් පේඩිගේ චින්තා කැලුම් ජයලත් මහතා
මාවනාන හේවා චන්දන මෛත්‍රීපාල මහතා
හල්වතුරගේ චම්පා කුමාරි සමරතුංග මිය
සුනිත් මලින්ද කරුණාරත්න මහතා
පේදුරු කංකානිගේ ශ්‍රේෂන් පද්මලාල් පෙරේරා මහතා
කරුණා ආරච්චිලාගේ සමරනායක ප්‍රනාන්දු මහතා
ප්‍රතාපසිංහ ආරච්චිගේ සිරිසෝම මහතා
ප්‍රීසිංහ ආරච්චිලාගේ ධම්මික ප්‍රසාද් ආරියරත්න මහතා
චාමින්ද සඳසෙන් සමරකෝන් මහතා,
අප්පුහාමිගේ නිශාන්ත නිශාන් හේරත් මහතා
හේවා වඩුගේ සුමුදු ගීතානන්ද වසන්තාරත්න මහතා
අකුරන්දෙනියේ ගෙදර ජයම්පති චමින්ද ගුණරත්න මහතා
පකීර් මොහිදීන් මොහොමඩ් ෆයිසාල් මහතා
කඳන්දෙනියේ ගෙදර රංජිත් කරුණාරත්න මහතා
හිටිනායක මුදියන්සේලාගේ රන් බණ්ඩා හිටිනායක මහතා
වතවන විතානගේ සුසන්ත විතානගේ මහතා
මීරිහාන කංකානම්ගේ සනත් ධම්මික මීරිහාන මහතා
දිසානායක මුදියන්සේලාගේ චන්දන ප්‍රියන්ත දිසානායක මහතා
ලසංක නිරූෂන් සෙන්දනායක මහතා
චන්දන සම්පත් කුමාර කරුණාරත්න මහතා
රාජපක්ෂ මුදියන්සේලාගේ සුසන්ත රාජපක්ෂ මහතා
සමරතුංග ගුණවර්ධන කෝරළගේ දොන් චලදේව මේඝාභය මහතා
හවුපගේ දෝන වරුණි විජායි මෙනවිය
දැහිගලගේ ජයන්ත චන්ද්‍රලාල් සමරවික්‍රම මහතා
දිසානායක මුදියන්සේලාගේ දර්ශන ඉන්ද්‍රජිත් ඉඹුල්දෙණිය මහතා
මල්ලිංග ගෙදර තුෂාර වික්‍රමසිංහ මහතා
උඩුමුල්ලේ ලේකම්රාළලාගේ විජේරත්න බණ්ඩාර මහතා
ජයසිංහ කංකානමලාගේ වසන්ත ධර්මසිරි ජයසිංහ මහතා
පරගහතොට පතිරගේ සසංකා සිතුමිණි ගුණසේකර මෙනවිය
යෝදගේ ප්‍රදීප් කුමාර සෝමසේන මහතා
රත්නායක මුදියන්සේලාගේ අරුණ කුසුම් දහනක මහතා
හේරත් මුදියන්සේලාගේ දිමුතු හේරත් මහතා
වල්ගම්පහේ අල්පොන්සා සම්පත් සිල්වා මහතා
හෙට්ටිආරච්චිගේ නිරෝෂණී පුෂ්පලතා කුමාරි මෙනවිය
සිරිල් සේනාරත්නගේ නාමල් විකුම් සේනාරත්න මහතා
කොග්ගල මරක්කල හේවගේ සනත් ප්‍රියන්ත මහතා
අබූබකර් අබ්දුල් රසාක් මහතා
මොහමඩ් මන්සූර් මොහමඩ් රිස්වාන් මහතා
හබීබ් ලෙබ්බෙ මොහමඩ් ෆයිස් මහතා

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 සැප්තැම්බර් මස 29 වැනි දින,
කොළඹ දීය.

11-90

# ආණ්ඩුවේ නිවේදන

### ග්‍රාම නාම වෙනස් කිරීම

මෙහි පහත සඳහන් පළමුවැනි උපලේඛනයේ දැක්වෙන ග්‍රාම නාමය, දෙවැනි උපලේඛනය ප්‍රකාරව වෙනස් කර ඇති බව පොදු දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආචාර්ය සරත් අමුණුගම,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

2006 ඔක්තෝබර් මස 11 වැනි දින.
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරි වසම* | *පළමුවැනි උපලේඛනය* | *දෙවැනි උපලේඛනය* |
|---|---|---|---|---|
| කුරුණෑගල | බමුණාකොටුව | 1214 නාථගනේ | මැටිඔළුව | මැදගමුව |

11-93

## 1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) නීතිය

### 3(2) වගන්තිය යටතේ නිදහස් කිරීමේ විධානය

1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) නීතියේ 3(2) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වෙළඳ, වාණිජ, පාරිභෝගික කටයුතු සහ අලෙවි සංවර්ධන අමාත්‍ය ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ වන මම මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිදහස් කිරීම සඳහා ඉල්ලා ඇති මෙහි උපලේඛනයේ සඳහන් සමාගමට ජාතික ජලසම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය සමග 2003.11.27 දින එළඹ ඇති ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා පමණක් යන කොන්දේසියට යටත්ව, එම නීතියේ 2 වැනි වගන්තියේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කරමින් විධානයක් නිකුත් කරමි.

ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ (පා. ම.),
වෙළඳ, වාණිජ, පාරිභෝගික කටයුතු
සහ අලෙවි සංවර්ධන අමාත්‍ය,
සහ මහාමාර්ග අමාත්‍ය
සහ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ
ප්‍රධාන සංවිධායක.

2006ක් වූ ඔක්තෝබර් මස 13 වැනි දින,
කොළඹ දී ය.

#### උපලේඛනය

යුනිහා වසීර් ටෙක්නොලොජි ජීඑම්බීඑච්

11-100

---

## 1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) නීතිය

### 3(2) වගන්තිය යටතේ නිදහස් කිරීමේ විධානය

1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) නීතියේ 3(2) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වෙළඳ, වාණිජ, පාරිභෝගික කටයුතු සහ අලෙවි සංවර්ධන අමාත්‍ය ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ වන මම මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිදහස් කිරීම සඳහා ඉල්ලා ඇති මෙහි උපලේඛනයේ සඳහන් සමාගමට ලංකා විදුලිබල මණ්ඩලය සමග 2005.11.14 දින එළඹ ඇති ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා පමණක් යන කොන්දේසියට යටත්ව, එම නීතියේ 2 වැනි වගන්තියේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කරමින් විධානයක් නිකුත් කරමි.

ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ (පා. ම.),
වෙළඳ, වාණිජ, පාරිභෝගික කටයුතු
සහ අලෙවි සංවර්ධන අමාත්‍ය,
සහ මහාමාර්ග අමාත්‍ය
සහ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ
ප්‍රධාන සංවිධායක.

2006ක් වූ ඔක්තෝබර් මස 13 වැනි දින,
කොළඹ දී ය.

#### උපලේඛනය

ද ෆුරුකාවා ඉලෙක්ට්‍රික් සීඕ, එල්ටීඩී

11-101

## 1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) නීතිය

### 3(2) වගන්තිය යටතේ නිදහස් කිරීමේ විධානය

1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) නීතියේ 3(2) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වෙළඳ, වාණිජ, පාරිභෝගික කටයුතු සහ අලෙවි සංවර්ධන අමාත්‍ය ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ වන මම මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිදහස් කිරීම සඳහා ඉල්ලා ඇති මෙහි උපලේඛනයේ සඳහන් සමාගමට ශ්‍රී ලංකාවේ දී සිල්ලර වෙළඳාමේ නොයෙදිය යුතුය යන කොන්දේසියට යටත්ව, එම නීතියේ 2 වැනි වගන්තියේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කරමින් විධානයක් නිකුත් කරමි.

ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ (පා. ම.),
වෙළඳ, වාණිජ, පාරිභෝගික කටයුතු
සහ අලෙවි සංවර්ධන අමාත්‍ය,
සහ මහාමාර්ග අමාත්‍ය
සහ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ
ප්‍රධාන සංවිධායක.

2006ක් වූ ඔක්තෝබර් මස 13 වැනි දින,
කොළඹ දී ය.

#### උපලේඛනය

ඇල්කාටෙල් සීඅයිටී

11-98

---

## 1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) නීතිය

### 3(2) වගන්තිය යටතේ නිදහස් කිරීමේ විධානය

1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) නීතියේ 3(2) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වෙළඳ, වාණිජ, පාරිභෝගික කටයුතු සහ අලෙවි සංවර්ධන අමාත්‍ය ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ වන මම මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිදහස් කිරීම සඳහා ඉල්ලා ඇති මෙහි උපලේඛනයේ සඳහන් සමාගමට මයිඩා කෝපරේෂන් සමාගම සමග ඇතුළත්ව ඇති ශ්‍රී ලංකාවේ ඉහළ කොත්මලේ විදුලිබල ව්‍යාපෘතියේ උප කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම සඳහා පමණක් යන කොන්දේසියට යටත්ව, එම නීතියේ 2 වැනි වගන්තියේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කරමින් විධානයක් නිකුත් කරමි.

ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ (පා. ම.),
වෙළඳ, වාණිජ, පාරිභෝගික කටයුතු
සහ අලෙවි සංවර්ධන අමාත්‍ය,
සහ මහාමාර්ග අමාත්‍ය
සහ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ
ප්‍රධාන සංවිධායක.

2006ක් වූ ඔක්තෝබර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

#### උපලේඛනය

කින්ඩන් කෝපරේෂන්

11-99

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මහජන බැංකුව - සීදූව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.02.24 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ජී. එන්. ඒකනායක විසින් සහතික කරන ලද 1997.12.19 දිනැති අංක 532 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් මුතුකුඩ ආරච්චිගේ ජගත් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දෙලක්ෂ දහඅටදහස් තුන්සිය හතලිස් එකයි ශත අනූ දෙක (රු. 2,18,341.92) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2001.09.26 දින සිට වර්ෂයකට 26% බැගින් රුපියල් දෙලක්ෂ දහඅටදහස් තුන්සිය හතලිස් එකයි ශත අනූදෙක (රු. 2,18,341.92)ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දෙලක්ෂ දහඅටදහස් තුන්සිය හතලිස් එකයි ශත අනූ දෙක (රු. 2,18,341.92)ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 532 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කටාන සීදුව නගර සභා කාර්යාල සීමාව තුළ අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, බණ්ඩාරවත්ත පිහිටි දවටගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. ඒ. කොස්තා විසින් 1977.02.24 දින මැන 1977.03.07 වැනි දින මැන සකස් කළ අංක 2526 දරන පිඹුරේ ලොට් අංක 9 දරන කොටසට මායිම් උතුරට : ලොට් එච් (අඩි 8ක් පළල පාර) සහ ලොට් ජී ද, නැගෙනහිරට : දඩුගම්ඔය ද, දකුණට : දඩුගම්ඔය සහ ලොට් එච් (අඩි 8ක් පළල පාර) ද. බස්නාහිරට : ලොට් 8 ද යන මායිම් තුළ පිහිටි පර්චස් අටයි දශම තුන (අ. 0, රූ. 0, පර්. 8.3) ක විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ අංක සී 804/193 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මන්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
බටහිර III කලාප කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

11-143

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-මිනුවන්ගොඩ ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2006.09.28 දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් පී. එම්. එම්. ප්‍රනාන්දු විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දා වූ 2003.03.27 දින සහ අංක 430 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගලිහිංග මල්ලිත් රොයි පෙරේරා ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ පනස්දෙදහස් තුන්සිය හැත්තෑතුනයි ශත හැත්තෑඑක (රු. 1,52,373.71) ක මුදලක් 2006.01.24 වැනි දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 1,52,373.71ක මුදලට 2006.01.25 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදල අඩුකොට එකී අංක 430 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහ පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ මිනුවන්ගොඩ උප කාර්යාලය සීමාව තුළ කලාහුංගොඩ පිහිටි "දවුල්ගහවත්ත" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක කේ. කේ. ඒ. එස්. පද්මිනි විසින් 1995.01.09 වැනි දින මැන සාදන ලද අංක 461 දරන පිඹුරෙන් බෙදාවෙන් කරන ලද ලොට් 2 දරන ඉඩමට උතුරට : ඇලෙන් සහ එම්. ආර්. ඒ. ජයසේකරගේ ඉඩමෙන් ද, නැගෙනහිරට : එම්. ආර්. ඒ. ජයසේකරගේ ඉඩමෙන් ද, දකුණට : ගම් සභා පාරෙන් ද, බටහිරට : ලොට් 1 සහ ඇලෙන් ද මායිම් වූ පර්චස් විසිහයයි දශම හයක් (අ. 0, රූ. 0, පර්. 26.06)ක් විශාලත්වය ඇති ඉඩම සහ ඊට අයත් ගොඩනැගිලි ආදී සියළු දේත් සමග වේ. මෙම ඉඩම මීගමුව දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 862/44 දරන ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

11-158/5

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - ගම්පොල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2006.09.28 දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ගම්පොළ ප්‍රසිද්ධ නොතාරිස් ටී. බී. අබේකෝන් විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දා වූ 2002.08.28 දින සහ අංක 3822 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දිසානායක මුදියන්සේලාගේ දිසානායක ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිඑක්ලක්ෂ අනූහයදහස් අටසිය හැටඑකයි ශත අසූහතර (රු. 2,196,861.84) ක මුදලක් 2006.05.31 වැනි දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 2,196,861.84ක මුදලට 2006.06.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදල අඩුකොට එකී අංක 3822 දරන උකස් බැඳුම්කරයන් මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛණයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර කඳුපළාත කෝරළේ, රත්මල් කඩුව දැන් ඇල්පිටිකන්ද ගමේ පිහිටි "උඩ සිංහපිටිය එස්ටේට්" *හෙවත්* "අක්කරසියවත්ත" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ඩී. එච්. කරුණාරත්න විසින් 1981ක් වූ මාර්තු මස 25 වැනි දින මැන සාදන ලද අංක 1439 ඒ දරන පිඹුරෙන බෙදා වෙන් කරන ලද ලොට් 7ඒ දරන කොටසට මායිම් උතුරට : ඉහත කී පිඹුර ප්‍රකාර එම ඉඩමේම කොටසක් වන ලොට් 5, 6 සහ 6ඒ ලෙස වෙන් කරන ලද කොටස් ද, දකුණට : බී. සහ සී ලෙස ලකුණු කරන ලද අඩි 10 පාරක් සඳහා වෙන් කරන ලද කොටස් ද, නැගෙනහිරට : ඉහත කී පිඹුරේ ලොට් 7බී දරන කොටසින් ද, බටහිරට : ලොට් ඒ සහ බී ලෙස ලකුණු කරන ලද අඩි 10ක් පළල පාරෙන් ද මායිම් වූ අක්කර හතරයි රූඩ් තුනයි පර්චස් විසි නවයක් (අ. 4, රූ. 3, පර්. 29)ක් විශාලත්වය ඇති ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි, වැව්ලි ආදී සියළු දේත් සමග අංක 1439ඒ හා 1981.03.25 වැනි දිනැති පිඹුර ප්‍රකාර ලකුණු කරන ලද ලොට් ඊ මතින් පදිකයින් හා යාන වාහන ගමන් කිරීමේ අයිතිය සහ මාර්ග ප්‍රවේශය ද සමග වේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී361/05 යටතේ ලියාපදිංචි කර ඇත.

2. කඳුපළාත කෝරළේ, රත්මල් කඩුව දැන් ඇල්පිටිකන්ද ගමේ පිහිටි "උඩ සිංහපිටිය එස්ටේට්" *හෙවත්* "අක්කරසියවත්ත" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ඩී. එච්. කරුණාරත්න විසින් 1981ක් වූ මාර්තු මස 25 වැනි දින මැන සාදන ලද අංක 1439ඒ දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට් 7සී දරන කොටසට මායිම් උතුරට : ලොට් බී සිට සී වලින් දක්වා ඇති අඩි 10ක් පළල පාර සඳහා වෙන් කරන ලද කොටසින් ද, නැගෙනහිරට : ඉහත කී පිඹුර ප්‍රකාර ලොඩ් 7ඩී දරන කොටසින් ද, දකුණට : කකල්දොල ඇලෙන් ද, සහ බටහිරට : ඉහත පිඹුර ප්‍රාකර එම ඉඩමේම කොටසක් වන ලොට් 9 දරන කොටසින් ද මායිම් වූ අක්කර හතරයි රූඩ් තුනයි පර්චස් විසි නවයක (අ. 4, රූ. 3, පර් .29)ක් විශාලත්වය ඇති ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි වැව්ලි ආදී සියළු දේත් සමග වේ. මෙම ඉඩම මහනුවර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 361/06 යටතේ ලියාපදිංචි කර ඇත.

3. කඳුපළාත කෝරළේ, රත්මල් කඩුව දැන් ඇල්පිටිකන්ද ගමේ පිහිටි "උඩ සිංහපිටිය එස්ටේට්" *හෙවත්* "අක්කරසියවත්ත" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ඩී. එච්. කරුණාරත්න විසින් 1981ක් වූ මාර්තු මස 25 වැනි දින මැන සාදන ලද අංක 1439ඒ දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 7බී දරන කොටසට මායිම්, උතුරට : ඉති වැටෙන් සහ එස්. පී. සමරකෝන්ගේ සහ තවත් අයට අයිති සිංහපිටිය තේ වත්තෙන් ද, නැගෙනහිරට : බැම්මෙන් සහ එස්. පී. සමරකෝන්ගේ සහ තවත් අයට අයිති සිංහපිටිය තේ වත්තෙන් ද, දකුණට : ඉහත කී පිඹුරෙන් වෙන් කරන ලොට් 7ඩී කොටසින් ද, සහ බටහිරට : ඉහත කී පිඹුරෙත් වෙන් කරන ලද ලොට් 7ඒ කොටසින් ද, මායිම් වූ අක්කර හතරයි රූඩ් තුනයි පර්චස් විසි නවයක් (අ. 4, රූ. 3, පර්. 29) ක් විශාලත්වය ඇති ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි, වැව්ලි ආදී සියළු දේත් සමග වේ. මෙම ඉඩම මහනුවර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 361/07 යටතේ ලියාපදිංචි කර ඇත.

4. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර, කඳුපළාත කෝරළේ, රත්මල් කඩුව දැන් ඇල්පිටිකන්ද ගමේ පිහිටි "උඩ සිංහපිටිය එස්ටේට්" *හෙවත්* "අක්කරසියවත්ත" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ඩී. එච්. කරුණාරත්න විසින් 1981ක් වූ මාර්තු මස 25 වැනි දින මැන සාදන ලද අංක 1439ඒ දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට් 7ඩී දරන කොටසට මායිම්, උතුරට : ඉහත සඳහන් පිඹුරේ ලොට් 7බී වලින් ද, නැගෙනහිරට : කේ. වී. පෙරේරාගේ ඇන්තනි තේ වත්තෙන් ද, දකුණට : කකුල්දොල ඇලෙන් සහ සිංහපිටියට යන පාරෙන් ද සහ බටහිරට : ඉහත කී පිඹුරේ ලොට් 7සී වලින් ද මායිම් වූ අක්කර හතරයි, රූඩ් තුනයි පර්චස් විසි නවයක් (අ. 4, රූ. 3, පර්. 29) ක් විශාලත්වය ඇති ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි, වැව්ලි ආදී සියළු දේත් සමග අංක 1439ඒ සහ 1981.03.25 වැනි දිනැති පිඹුර ප්‍රකාර ලකුණු කරන ලද ලොට් ඊ මතින් පදිකයින් සහ යාන වාහන ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සහ මාර්ග ප්‍රවේශය ද සමග වේ. මෙම ඉඩම මහනුවර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 361/08 යටතේ ලියාපදිංචි කර ඇත.

ගම්පොල ප්‍රසිද්ධ නොතාරිස් ටී. බී. අබේකෝන් විසින් 2002 අගෝස්තු මස 28 වැනි දින ලියා සහතික කරන ලද අංක 3822 බැඳුම්කරයේ උපලේඛනයේ සඳහන් අංක 1439ඒ පිඹුර ප්‍රකාර ලොට් 7ඊ සහ ලොට් 8 මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණී ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

11-158/4

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - බොරලැස්ගමුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2006.05.25 දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. සේනානායක විසින් සහතික කරන ලද්දා වූ ද, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දා වූ 2004.05.03 දින සහ අංක 1127 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම "දිනුකි එන්ටර්ප්‍රයිසස්" යන නාමය විලාශය හා ව්‍යාපාර නාමය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන වික්‍රමගේ ජනක පුෂ්ප කුමාර යන අය ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිතුන් ලක්ෂ විසිපන්දහස් නවසිය තිහයි (රු. 2,325,930) ක මුදලක් 2005.03.31 වැනි දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 2,325,930ක මුදලට 2005.04.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදල අඩුකොට එකී අංක 1127 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛණයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එන්. එච්. පී. එෆ්ජ්. ආරියරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාව තුළ, මහරගම පිහිටි ජයගත් පාර, වරිපනම් අංක 78/2හි "කහටගහවත්ත" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක එච්. කේ. මහින්ද විසින් වර්ෂ 2003ක් වූ දෙසැම්බර් මස 31 වැනි දින මැන සාදන ලද අංක 2150 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : ජයගත් පාරේ, වරිපනම් අංක 80 සහ 80/1 දරන දේපළ සහ සිරිල් පෙරේරා හිමිකම් කියන වැත්තැබොඩ ඔිවිට ද, නැගෙනහිරට : සිරිල් පෙරේරා හිමිකම් කියන වැත්තැබොඩ ඔිවිටෙන් සහ ජයගත් පාරේ වරිපනම් අංක 76 දරන ඉඩමෙන් ද, දකුණට : ජයගත් පාරේ, වරිපනම් අංක 76 සහ 78/1 දරන පරිශ්‍රවලින් සහ පාරෙන් ද (අංක 1960 දරන පිඹුරේ ලොට් 4 දරන ඉඩම ද), බටහිරට : පාරෙන් (අංක 1960 දරන පිඹුරේ ලොට් 4 න් ද) ජයගත් පාරේ වරිපනම් අංක 80 සහ 80/1 න් මායිම් වූ එකී අංක 2150 දරන පිඹුර ප්‍රකාර මායිම් වූ පර්චස් දහහතරයි දශම හතයි එකක් (අ. 0, රූ. 0, පර්. 14.71) ක් විශාලත්වය ඇති ඉඩම අංක 2150 දරන පිඹුර ප්‍රකාරව වේ.

ප්‍රසිද්ධ නොතාරිස් කේ. සේනානායක විසින් 2004.05.03 වැනි දින ලියා සහතික කරන ලද අංක 1127 දරන බැඳුම්කරයේ හි දෙවන උපලේඛනය වැඩිදුරටත් විස්තර කරන මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණී ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

11-158/6

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - මස්කෙළිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

වර්ෂ 2006 සැප්තැම්බර් මස 28 වැනි දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ගම්පොළ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. සී. සී. ඒකනායක විසින් සහතික කරන ලද්දාවූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 2005ක් වූ ජූලි මස 23 වැනි දින සහ 1919 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ජයමනි සුරේන්ද්‍රන් ණයකරු හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දසලක්ෂ හැටතුන් දහස් හත්සිය තිස් හතරයි ශත විසිනවයක (රු. 1,063,734.29) මුදලක් 2006.02.28 දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී (රු. 1,063,734.29) මුදලට 2006.03.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1919 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රයන් කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, උඩ බුලත්ගම පළාතේ, අඹගමුව කෝරළේ, මස්කෙළියේ පිහිටි, මාවුස්සාකැලේ එස්ටේට් හි එක්සෝල්සන්ඩ් ඩිවිසන්ස් නමින් හඳුන්වනු ලබන කොටසට බලයලත් මානක ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් 1988ක් වූ අගෝස්තු මස 07 වැනි දින මැන සාදන ලද අංක 3866 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01 දරන ඉඩම් කොටසට මායිම් උතුරට : බැම්මෙන් වෙන් කරන ලද මාවුස්සාකැලේ එස්ටේට්හි එකොල්සන්ට් ඩිවිසන්ස් නමින් හඳුන්වනු ලබන මෙම ඉඩමේ ඉතිරි කොටසින් ද, නැගෙනහිරට සහ දකුණට : ඉනි වැටෙන් වෙන් කරන ලද මාවුස්සාකැලේ එස්ටේට්හි එකොල්සන්ඩ් ඩිවිසන්ස් හඳුන්වනු ලබන මෙම ඉඩමේම ඉතිරි කොටසින් ද, බටහිරට : මස්කෙළිය සිට නෝර්ටන් බ්‍රිජ් දක්වා දිවෙන පාරෙන් ද, මායිම් වූ රූඩ් දෙකයි, පර්චස් දහහතරයි දශම අටයි බින්දුව (අ. 0, රූ. 2, පර්. 14.80) ක් විශාලත්වය ඇති ඉඩම සහ ඊට අදාළ ගොඩනැගිලි ආදී සියළු දේත් සමග වේ. මෙම ඉඩම ගම්පොළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 30/395 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණී ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

11-158/1

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - හෝමාගම ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

වර්ෂ 2006 සැප්තැම්බර් මස 28 වැනි දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. ටී. ධර්මතිලක විසින් සහති කරන ලද්දාවූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 2002ක්

වූ ජුනි මස 14 වැනි දින අංක 311 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ශාන්ත ප්‍රදීප් කුලරත්න ණයකරු හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ හාරදහස් එකසිය දහනවයයි ශත හතලිස් අටක (රු. 4,04,119.48) මුදලක් 2006.02.28 දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 4,04,119.48 මුදලද, 2006.03.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙන් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 311 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රයන් කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අර්වින් පෙරේරා මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

සබරගමුව පළාතේ, (අවිස්සාවේල්ල ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ) කෑගල්ල දිස්ත්‍රික්කයේ, තුන් කෝරළේ, පනාවල් කෝරළේ, දෙහිඕවිට ප්‍රාදේශීය සභා සීමාව තුළ මාදොල ගමේ පිහිටි "හෙරිෆර්ඩ් එස්ටේට්" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක එන්. පී ඇල්විටිගල විසින් 1994.11.14 වැනි දින මැන සාදන ලද අංක 546 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 197 දරන ඉඩම මායිම් උතුරට : ලොට් 177 සහ 178 ද, නැගෙනහිරට ලොට් 196 ද, දකුණට : ලොට් 271 (පාරෙන්ද) ද, බටහිරට : ලොට් 198 සහ 176න් ද මායිම් වූ පර්චස් දොළහක් (අ. 0, රූ. 0, පර්. 12) විශාලත්වය ඇති ඉඩම වේ. මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ආර් 72/164 දරන ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. ටී. ධර්මතිලක විසින් 2002.06.14 වැනි දින ලියා සහතික කරන ලද අංක 311 දරන බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ විස්තර වන මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණී ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

11-158/2

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-මාතලේ ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

වර්ෂ 2006 සැප්තැම්බර් මස 28 වැනි දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 2005.02.15 වැනි දින සහ අංක 601 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අබ්දුල් කරීම් මොහමඩ් රිසාර්ඩ් ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ අනූදෙදහස් එකසිය හතලිස්තුනයි ශත හතර (රු. 4,92,143.04)ක් මුදලක් 2006.03.31 වැනි දිනට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් 4,92,143.04ක මුදලට 2006.04.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 601 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දැනට මාතලේ නැගෙනහිර රත්තොට නගර සභා සීමාව තුළ, මාතලේ නැගෙනහිර පල්ලේසිය පත්තුවේ, රත්තොට හොම්පොලතැන්නේ පිහිටි වරිපනම් අංක 18 දරන කහටගහමුලවත්ත හෙවත් කහටගහමුලහේන නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ඒ. දොලොස්වැල විසින් 1966.10.10 වැනි දින සහ බලයලත් මානක ජේ. එම්. ජයසේකර විසින් 1968.04.01 වැනි දින සාදන ලද අංක 104 දරන උප බෙදුම ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ඩී1 දරන ඉඩමට ඊසානදිගට : අංක 104 දරන පිඹුරේ ලොට් ඩී2 න් ද, ගිණිකොන දිසාවට : ලොට් 104 දරන පිඹුරේ ලොට් ඩී2 ද, දකුණට : අංක 104 දරන පිඹුරේ ලොට් සී වලින් ද, වයඹට : කන්දප්පාට අයිති ඉඩමෙන් ද, මායිම් වූ පර්චස් තුනක් (අ. 0, රූ. 0, පර්. 3) විශාලත්වය ඇති ඉඩම වේ. එය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී242/110 දරන ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දැනට මාතලේ නැගෙනහිර රත්තොට නගර සභා සීමාව තුළ, මාතලේ නැගෙනහිර පල්ලේසිය පත්තුවේ, රත්තොට හොම්පොලතැන්නේ පිහිටි වරිපනම් අංක 18 දරන කහටගහමුලවත්ත හෙවත් කහටගහමුලහේන නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ඒ. දොලොස්වල විසින් 1966.10.10 වැනි දින සහ බලයලත් මාකන ජේ. එම්. ජයසේකර විසින් 1968.04.01 වැනි දින සාදන ලද අංක 104 දරන උප බෙදුම ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් සී දරන ඉඩමට උතුරට : පිඹුරු අංක 104හි ලොට් ඩී1න් ද, නැගෙනහිරට : පිඹුරු අංක 104හි ලොට් ඩී2න් ද, ගිණිකොණට : පිඹුරු අංක 104 ප්‍රකාර ලොට් සී වල ඉතිරි කොටසින් ද, දකුණට සහ නිරිතට : තාප්පයෙන් ද, බටහිරට : කන්දප්පාට අයිති ඉඩමෙන් ද, මායිම් වූ පර්චස් එකයි දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 1.2) විශාලත්වය ඇති ඉඩම වේ. මෙම ඉඩම මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 242/111 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි"

ඉන්ද්‍රාණී ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති),
මණ්ඩලයේ ලේකම්.

11-158/3

## රුහුණ සංවර්ධන බැංකුව-දෙනියාය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන *අති විශෙෂ ගැසට්* නිවේදනයට අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2004.11.04 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව එකමතිකව සම්මත කරන ලදී :

"රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් සුමිත් එම්. පස්ගොඩ මහතා විසින් සහතික කරන ලද 2002.11.20 දින හා අංක 984 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කිරිවැල්දොල දෙනියායේ පදිංචි මුණසිංහගේ පියදාස සහ මුණසිංහගේ ඥාණවතී යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හැටපන්දහස් දෙසියයක (රු. 1,65,200) මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින් ද, 2003.12.30 වැනි දින සිට වර්ෂයකට 21% බැගින් රුපියල් එක්ලක්ෂ හැටපන්දහස් දෙසීයයක (රු. 1,65,200) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා වෙන්දේසි වියදම් ද සමහ අනතුරුව කිසියම් මුදලක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 984 උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.".

#### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක් කෝරළේ, පල්ලේගම ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ පල්ලේගම නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අ. ග. පි. 170 දරන පිඹුරේ ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් දහ හතක් (අ. 1, පර්. 0, පර්. 17) ක් විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම උතුරට : ආර්. පී. සියදෝරිස්ගේ ඉඩම ද, නැගෙනහිරට : එම්. පී. ආරියදාසගේ ඉඩම ද, දකුණට : එම්. එස්. වයි. හෙන්ද්‍රික්ගේ ඉඩම ද, බස්නාහිරට : ගල්ඇන්ද ද වේ.

මෙම දේපළ මොරවක ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ 2002.11.27 දින අංක වං. 6/36 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ටී. ජී. විමලරත්න,
සාමාන්‍යාධිකාරී.

රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය, පඹුරන,
මාතර.

11-108

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුනු යෝජනාව

ණය අංකය : 6/35124/පී6/304.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.06.29 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

"1. පානදුර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එල්. වීරසේකර විසින් සහතික කරන ලද 1998.08.26 දින හා අංක 2658 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම පානදුර පදිංචි වරුස හැන්නදිගේ සුනිල් සොයිසා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.06.10 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන්ලක්ෂ පනස්දහස් හාරසිය හැත්තෑ නවයයි ශත විසිහතරක (රු. 3,50,479.24) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2658 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් අනූපහයි ශත අසූව (රු. 95.80) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, වාද්දුව, තල්පිටිය උතුර, මැද පාර, අංක 40හි බලයලත් වෙන්දේසිකාර ඩී. පී. එල්. සී. ද සිල්වා මහතාට බලය පැවරිය යුතු වන්නේය.".

#### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්දහි පානදුර ප්‍රාදේශීය සභා සීමාවේ දිබ්බැද්ද පිහිටි ගොලුකොටුව වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. ආර්. ජයසේකර විසින් 1997.09.01 දින සකසන ලද අංක 113 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 35 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 20.7ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

තව ද සර්වේයර් ජනරාල් විසින් සකසන ලද 1980.10.15 දිනැති අංක 1760 දරන මිණුම් පිඹුරේ දක්වා ඇති මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2006 ඔක්තෝබර් මස 20 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

11-153/5

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57(2) වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුනු යෝජනාව

ණය අංකය : කේ/16/0670/කේවයි1/490.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.06.29 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

"1. දියසෙන්පුර, විජයපුර, යාය 6, අංක 1133හි පදිංචිව සිටි කන්දේආරච්චිලාගේ තෙන්නකෝන් බණ්ඩා යන අයට 20.5%ක වාර්ෂික පොලියක් මත වසර 10න් ආපසු ගෙවිය යුතු රු. 1,10,000ක ණය මුදලක්, කෘෂිකාර්මික කටයුතු සඳහා ට්‍රැක්ටරයක් මිළදී ගැනීම සඳහා ප්‍රදානය කරන ලද බැවින් ද,

2. එකී කන්දෙආරච්චිලාගේ තෙන්නකෝන් බණ්ඩා යන අය 2000.12.08 වැනි දින මියගිය බැවින් කොළඹ දිසා අධිකරණයේ නඩු අංක 5457/සීජී යටතේ 2006.05.18 දිනැති නියෝගය මගින් මියගිය කන්දෙආරච්චිලාගේ තෙන්නකෝන් බණ්ඩා යන අයගේ බූදලය නියෝජනය කිරීම සඳහා ඔහුගේ බිරිඳ වන හේරත් මුදියන්සේලාගේ කුඩාමැණිකේ යන අයව පත් කර ඇති බැවින් ද,

3. පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් එල්. එල්. එම්. ද සිල්වා විසින් සහතික කරන ලද 1995.06.28 දින හා අංක 123 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම එකී හේරත් මුදියන්සේලාගේ කුඩාමැණිකේ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.05.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ හැටදහස් හත්සිය හැටදෙකයි ශත හැත්තෑවක (රු. 2,60,762.70) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 123 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් පනස් හයයි ශත දහඅට (රු. 56.18) බැගින් වැඩිපුර පොළි ද අයවිය යුතුව ඇති බැවින් ද,

4. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කොළඹ 12, අලුත්කඩේ වීදිය, අංක 186/2හි බලයලත් වෙන්දේසිකාර කේ. පී. එන්. සිල්වා මහතාට බලය පැවරිය යුතු වන්නේය.".

#### උපලේඛනය

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ප්‍රාදේශීය ආදායම් නිළධාරි කොට්ඨාසයේ විජයපුර ග්‍රාම සේවා වසමේ කවුඩුලුවැව I පියවරෙහි පිහිටි දියසෙන්පුර යාය නමැති ඉඩමේ සර්වේයර් ජනරාල් විසින් සකසන ලද හා අංක අ. ජ. පි. පො. 319 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 98 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.665ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන සාමාන්‍යධිකාරි.*

2006 ඔක්තෝබර් මස 20 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

11-153/7

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුනු යෝජනාව

ණය අංක : 1/29204/සීඩී1/164, 32250/සීඩී2/349.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2004.07.09 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

"1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එස්. ප්‍රේමවර්ධන විසින් සහතික කරන ලද 1996.11.05 සහ 1997.09.11 දින හා අංක 6301 සහ 7423 දරන උකස් බැඳුම්කර මත අය විය යුතු මුදල් ගෙවීම කෝට්ටේ පදිංචි බර්නිවල ලියනගේ ලලිතා චන්ද්‍රා කුලතිලක යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2004.06.01 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ විසිනවදහස් හත්සිය හැටයි ශත හතලිස් නවයක (රු. 1,29,760.49) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 6301 සහ 7423 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් පනස් එකයි ශතය (රු. 51.01) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතාට බලය පැවරිය යුතු වන්නේය.".

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය සභාවේ, බත්තරමුල්ල ඒකක සීමාව තුළ උතුරු තලංගම පිහිටි කැකුණගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු පී. ෆීලික්ස් ඩයස් විසින් සකසන ලද 1991.10.10 දිනැති හා අංක 214ඒ දරන මිණුම් පිඹුරේ කැබලි අංක 23බී1 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 5.94ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ

තව ද, බලයලත් මිනින්දෝරු ඩී. එල්. පීරිස් විසින් සැකසුණු 1975.09.21 දිනැති හා අංක 2725 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 36, 37, 40 සහ 41 මතින් වැටී ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන සාමාන්‍යධිකාරි.*

2006 ඔක්තෝබර් මස 20 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

11-153/4

## මහජන බැංකුව - කැලණිය ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.05.03 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

"ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2001.10.18 දිනැති අංක 6434 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, මිද්දෙණිය මාලගේ අනිල් ප්‍රසන්න සහ වීරසූරිය ආරච්චිගේ නිලන්ති යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දෙලක්ෂ හැත්තෑනමදහස් හයසිය අසූහතයි ශත දහහතරක (රු. 2,79,687.14) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2003.09.24 දින සිට වර්ෂයකට 26% බැගින් රුපියල් දෙලක්ෂ හැත්තෑනමදහස් හයසිය අසූහතයි ශත දහහතරක (රු. 2,79,687.14) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද, සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දෙලක්ෂ හැත්තෑනමදහස් හයසිය අසූහතයි ශත දහහතරක (රු. 2,79,687.14) මුදල අයකර ගැනීම සඳහා ගම්පහ බලයලත් වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් විසින් එකී අංක 6434 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.".

### දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභාවේ දෙල්ගොඩ උප කාර්යාල සීමාව තුළ සියඹලාපෙ පිහිටි කහටගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. පී. වීරසේකර විසින් 1993.08.10 වැනි දින මැන සකස් කළ අංක 939 දරන පිඹුරේ ලොට් අංක 01 දරන කොටසට මායිම්, උතුරට : ජේ. උණරත්නට අයත් ඉඩම ද, නැගෙනහිරට : අඩි 20ක් පළල පාර ද, දකුණට : එම්. ඒ. අමිල සහ වජිරට අයත් ඉඩම ද, බස්නාහිරට : පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 249/340හි ලියාපදිංචි කර ඇත. ඉහත කී පිඹුරේ පාරවල්වල අයිතීන් සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
බටහිර III කලාප කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

11-145

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුනු යෝජනාව

ණය අංකය : 6/39318/එල්6/762.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.05.03 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී.

"1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඩී. මලගොඩ විසින් සහතික කරන ලද 2000.05.03 දින හා අංක 1458 දරන උකස් බැදුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම මොරටුව පදිංචි වීරහැන්නදිගේ සුජිත් නිශාන්ත ප්‍රනාන්දු යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.04.10 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තිස්පන්දහස් තුන්සිය එකොළහයි ශත දහ අටක (රු. 35,311.18) මුදලක් ද, පූර්වෝක්ත බැදුම්කර අංක 1458 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් දොලහයි ශත හතලිස් එක (රු.12.41) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පානදුර, ඩයස් ගොඩනැගිල්ලෙ හි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.".

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුනේ උතුර පයාගල බැද්ද හි බේරුවල ප්‍රාදේශීය සභා සීමාවේ (පයාගල මග්ගොන බැද්ද උප කාර්යාලය) දූවේගොඩ පිහිටි සුදුගහලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් සකසන ලද 1999 පෙබරවාරි 25, 26, 27 හා 1999.03.05 දින හා අංක 2526 දරන පිඹුරේ කැබලි අංක 134 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ, 0, පර්. 10ක් වූ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

තව ද, එකී මිණුම් පිඹුරේ කැබලි අංක ආර්. 5 (අඩි 15 ක් පළල පාර), ආර්. 1, ආර්. 2, ආර්. 3, ආර්. 4, ආර්. 6, ආර්. 7, ආර්. 8 සහ ආර්. 9 මතින් දක්වා ඇති මාර්ග අයිතීන් ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. ඩී. මෙන්ඩිස්,
වැඩබලන සාමාන්‍යාධිකාරී.

2006 ඔක්තෝබර් මස 20 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

11-153/8

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්

### නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් හි අධ්‍යක්ෂවරුන් අතරේ බෙදාහැරීමේ යෝජනා සම්මතයෙන් සම්මත කරගත් යෝජනාව

පහත දැක්වෙන යෝජනා සම්මුතිය නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2006.06.15 වන දින ඒකමතිකව අනුමත කරන ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ :

"මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් චේතිය පද්මසිරි සුහසිංහ විසින් සහතික කරන ලද වර්ෂ 2004ක් වූ දෙසැම්බර් මස 23 වන දිනැති අංක 2134 දරන උකස් බැඳුම්කරය මගින්, පිළියන්දල, තුම්බෝවිල, ආසිරි පෙදෙස, අංක 55/6 දරන ස්ථානයේ නිරූපිකා ක්‍රිස්ටලින් පෙරේරා යන අය විසින් ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි ලෙස ආපසු ගෙවීමට ඇපයක් වශයෙන් මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති අයිතීන්, දේපල සහ පරිශ්‍රයන්, කොළඹ 01, යෝර්ක් වීදියේ, අංක 76 හි පිහිටි (මෙහි මින් මතු 'බැංකුව' යනුවෙන් සඳහන් කෙරෙන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වෙත උකස් කරන ලද හෙයින් ද,

තව ද, එකී බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල ගෙවීමට එකී නිරූපිකා ක්‍රිස්ටලින් පෙරේරා යන අය පැහැර හරින ලදුව වර්ෂ 2006ක් වූ මාර්තු මස 07 වන දින වන විට නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වෙත එකී බැඳුම්කරය මත රුපියල් අටලක්ෂ දහතුන් දහස් අනූ දෙකයි ශත අනූ පහක (රු. 8,13,092.95) මුදලක් දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද,

මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති අයිතීන් දේපළ සහ පරිශ්‍රයන්, එකී රුපියල් අටලක්ෂ දහතුන් දහස් අනූදෙකයි ශත අනූ පහක (රු. 8,13,092.95) මුදල ද, වර්ෂ 2006 ක් වූ මාර්තු මස 07 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වර්ෂ 2006 ක් වූ මාර්තු මස 07 වැනි දින විට කාල ණය මත හිඟව ඇති ප්‍රාග්ධනය වන රුපියල් අට ලක්ෂ දෙදහස් නවසිය අසූ අටයි ශත විසි හතක (රු. 8,02,988.27) මුදලක් මත එක් වර්ෂයකට 19% ක අනුප්‍රමාණය බැගින් තවදුරටත් පොළිය ද, ඒ සමග අනුගාමී ගාස්තු ද, ප්‍රචාරය කිරීමේ ගාස්තු ද, වැය කරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, පහසුකම ලබාගත් දින සිට ගෙවා ඇති (කිසියම් මුදලක් වේ නම්) මුදල අඩු කළ පසු මුදල, අයකර ගැනීම සඳහා කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි ත්‍රිවංක සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබීමට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.".

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර පල්ලේගම්පහ කෝරලේ වත්තේගම පිහිටි (බලයලත් මිනින්දෝරු බී. පී. රූපසිංහ විසින් සාදන ලද වර්ෂ 1991ක් වූ අගෝස්තු මස 17 වන දිනැති අංක 938 දරන පිඹුරේ ලොට් 01 වශයෙන් දැක්වෙන) කොළඹ බලයලත් මිනින්දෝරු සී. වී. ඒ. විතාරණ විසින් සාදන ලද වර්ෂ 2001ක් වූ පෙබරවාරි මස 09 වන දිනැති අංක 2220 දරන පිඹුරේ ලොට් 01 වශයෙන් සලකුණු කර දක්වා ඇති අතලාහගොඩපිටියේ වත්ත සහ ඉඹුලාවල මැදවලව්වේවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමින් බෙදා වෙන් කර දක්වා ඇති ඉඩම් කොටස එකී ලොට් 01 දරන ඉඩම් කැබැල්ලට මායිම්, වයඹට : ලොට් 02 ද, ඊසානට : අතලාහගොඩ පටුමග ද, නිරිතට : ලොට් 02 ද සහ, ගිණිකොණට : ලොට් 02 ද, වන ප්‍රමාණයෙන් පර්චස් තිස් පහයි දශම තුනක් (අ. 0, රු. 0, පර්. 35.3) වන එකී අංක 2022 දරන පිඹුර ප්‍රකාරව, එහි පිහිටි ගොඩනැගිලි සහ සියළුම දේ සමග වූ ඉඩම. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු ඊ 763/203 හි ලියාපදිංචි වී ඇත.

අංක 2022 දරන පිඹුරේ එකී ලොට් 01 මෙහි පහත දැක්වෙන ඉඩමේ කොටසක් වේ :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර පල්ලේගම්පහ කෝරලේ, වත්තේගම පිහිටි බලයලත් මිනින්දෝරු බී. පී. රූපසිංහ විසින් සාදන ලද වර්ෂ 1991ක් වූ අගෝස්තු මස 17 වන දිනැති අංක 938 දරන පිඹුරේ ලොට් 01 වශයෙන් දැක්වෙන අතලාහගොඩපිටියේ වත්ත සහ ඉඹුලාවල, මැදවලව්වේවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම් කොටස් එකිනෙකට ඒකාබද්ධ කොට එක් දේපලක් වශයෙන් වූ බෙදා වෙන්කර ඇති ඉඩම් කොටස එකී ලොට් 01 දරන කැබැල්ලට මායිම් : ඊසානට : අටලහගොඩහේන ද, නැගෙනහිරට : බෝගහමුල්ල මුදුන ද, දකුණට : පංගොල්ලේ වත්ත සහ තොටුවත්ත සහ බස්නාහිරට සහ වයඹට : යටිරාවන සිට එන අඩිපාර ද වන ප්‍රමාණයෙන් අක්කර 1 යි, රූඩ් 01 යි, පර්චස් තිස් පහයි දශම පහක් (අ. 1, රූ. 1, පර්. 35.5) වන එකී අංක 938 දරන පිඹුර ප්‍රකාරව, එහි පිහිටි ගොඩනැගිලි සහ සියළුම දේ සමග වූ ඉඩම. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම සහ පත්ඉරු ඊ 625/82 හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 76, යෝර්ක් වීදිය,
කොළඹ 01.

11-95

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංක : 96647 සහ 72818 - පැට්‍රික් ෆර්නිචර්ස්.

2003 ජුනි මස 27 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලදී :

"පානදුර ප්‍රසිද්ධ නොතාරිස් යූ. ඩී. පියසේන විසින් සහතික කරන ලද්දාවූ ද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ ද, 1999 ජූලි මස 30 වන දින හා අංක 862 සහ 1999 ජූලි මස 30 වැනි දින හා අංක එම්බී/පීවීඑන්/99/02 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පැට්‍රික් ෆර්නිචර්ස් යන නාමය, විලාශය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන බෙමිනහෙන්නැදිගේ හියුබර්ට් පැට්‍රික් ප්‍රනාන්දු සහ බෙමිනහෙන්නැදිගේ ලොරින්ඩා ප්‍රනාන්දු ණයකරු හැටියට ද සහ බෙමිනහෙන්නැදිගේ ලොරින්ඩා ප්‍රනාන්දු උකස්කරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දාහත් ලක්ෂ විසිපන් දහස් පන්සිය විසිනවයයි ශත අසූ හතක (රු. 17,25,529.87) මුදලක් 2003 මාර්තු මස 31 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්ට අයවිය යුතු ව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දාහත් ලක්ෂ විසිපන් දහස් පන්සිය විසිනවයයි ශත අසූ හතක (රු. 17,25,529.87) මුදලට 2003 අප්‍රේල් මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 12,39,329.85 ක මුදල සඳහා 14%ක වැඩිදුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම්

මුදලක් වේ නම් ඒ මුදලත් අඩුකොට එකී අංක 862 සහ එම්බී/පීඑච්එන්/ 99/02 දරන උකස් බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස් කොට ඇත්තා වූ ද, මෙහි පහත 1 සහ 2 උපලේඛනයන්හි සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපල සහ පරිශ්‍රයන් සහ වෙළඳ තොග කොළඹ 12, හල්ස්ඩ්‍රොප් වීදියේ, අංක 99හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කරගනී.”.

### පළමුවන උපලේඛනය

බලයලත් මානක බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 5905 දරන පිඹුරේ පෙන්වා ඇති පරිදි බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ පානදුර තල්පිටි දෙබද්දෙහි පානදුර ප්‍රාදේශීය සභාවේ, කෙසෙල්වත්ත උපකාර්යාල සීමාව තුළ ගොරකපොල පිහිටි අඹගහවත්ත ඒකාබද්ධ ඉඩමට මායිම් - උතුරට : (අංක 390 දරන පිඹුරේ පෙන්වා ඇති ලොට් ඒ 1 සහ ඩී 1 පාර ද, නැගෙනහිරට : 2743 දරන පිඹුරේ පෙන්වා ඇති ලොට් බී 3 ද, දකුණට : අංක 2743 දරන පිඹුරේ ලොට් බී 3 සහ අංක 390 දරන පිඹුරේ ලොට් ඒ 2 ද සහ බස්නාහිරට : අංක 390 දරන පිඹුරෙ ලොට් ඒ2 ද යන මායිම් තුළ පර්චස් විසිඅටයි දශම හතයි පහක (අ. 0, රූ. 0, පර්. 28.75) හෝ (හෙක්ටයාර් 0.07271) විශාලත්වයෙන් යුත් ඉඩම පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එෆ් 341/232 යටතේ ලියාපදිංචි වී ඇත.

### දෙවන උපලේඛනය

(ශ්‍රී ලංකා ජනරජයේ බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කය තුළ) පානදුර, ගොරකාපොළ ඥානසේන මාවතේ, ‘ගන්ගාසල’, අංක 133 හි පැට්‍රික් ෆර්නිචර්ස් ගොඩනැගිල්ලේ දැනට උඩ සහ ඇතුලත තැන්පත් කොට ඇති ණය කරු සතු කුමන හෝ සමාගමේ ඇති දැව තොග, සාදා නිමකළ බඩු, යන්ත්‍රෝපකරණ, සහ වෙනත් චංචල වත්කම් සහ කුමන හෝ ව්‍යාපාර වස්තු තොග, වෙළඳ භාණ්ඩ සහ සියලු දේත් තනිව හෝ සියල්ල වශයෙන් සහ දැනට හෝ යම් කාලයක ණයකරු සතුව තිබෙන ලද ගොඩනැගිලිවල සහ ගබඩාවල තිබෙන ලද හා ඇති වෙනත් දේ ද, කලින් කල සහ ඊට පසු කරගෙන ගිය වෙළඳ ව්‍යාපාරය සතු වෙළඳ ගබඩා සහ වෙළඳ භාණ්ඩ සහ සියලු දේ ද, කලින් කල ගබඩා කරන ලද වෙළඳ භාණ්ඩ තොග ද, කලින් කල මින් ඉදිරියට ගබඩා කරනු ලබන හෝ වෙනත් ස්ථානවල හෝ ගබඩා තුළ හෝ ඉහත කී ගොඩනැගිල්ලේ ගබඩා කරනු ලබන හෝ ණයකරු සතු වෙළඳ මධ්‍යස්ථාන වල තැන්පත් කොට තිබී වෙළඳාම පිණිස ඉවත් කරනු ලබන භාණ්ඩ සහ මීට පෙර සඳහන් කරන ලද එකී භාණ්ඩ තොගය ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

11-139

---

### මහජන බැංකුව - කඩවත ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.01.07 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

“ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් සහතික කරන ලද 1997.05.15 දිනැති අංක 123 දරන උකස්කරය සහ 1999.03.18 දිනැති අංක 1692 දරන උකස්කරය ද, ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2001.08.14 දිනැති අංක 6251 දරන උකස්කරය ද ප්‍රකාර ගෙවීම්, හෙට්ටි කන්කානම්ගේ සිරිසේන සහ හෙට්ටි කන්කානම්ගේ චම්පික ප්‍රියදර්ශන යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හයලක්ෂ හතලිස් හත් දහස් අටසිය පනස් හතරයි ශත අසූහය (රු. 6,47,854.86), රුපියල් විසි දෙලක්ෂ හැට අටදහස් හත්සිය අනූනමයයි ශත පනස් දෙක (රු. 22,68,799.52), රුපියල් දොලොස්ලක්ෂ හාරසිය පනහයි ශත අසූ අට (රු. 12,00,450.88) සහ රුපියල් තුන් ලක්ෂ පනස් හයදහස් හාරසිය අසූතුනයි ශත හතලිස් පහක් (රු. 3,56,483.45) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2003.11.05 දින සිට වර්ෂයකට 21% බැගින් රුපියල් හයලක්ෂ හතලිස් හත් දහස් අටසිය පනස් හතරයි ශත අසූහය (රු 6,47,854.86) 2004.02.10 දින සිට වර්ෂයකට 21.5% බැගින් රුපියල් විසිදෙලක්ෂ හැටඅටදහස් හත්සිය අනූනමයයි ශත පනස් දෙක (රු. 22,68,799.52) 2003.11.05 දින සිට වර්ෂයකට 23.5% බැගින් රුපියල් දොලොස්ලක්ෂ හාරසියපනහයි ශත අසූඅට (රු. 12,00,450.88) සහ 2004.07.31 දින සිට වර්ෂයකට 31% බැගින් රුපියල් තුන් ලක්ෂ පනස්හයදහස් හාරසිය අසූ තුනයි ශත හතලිස් පහක (රු. 3,56,483.45) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හයලක්ෂ හතලිස් හත් දහස් අටසිය පනස් හතරයි ශත අසූහය (රු. 6,47,854.86), රුපියල් විසිදෙලක්ෂ හැට අටදහස් හත්සිය අනූනමයයි ශත පනස් දෙක (රු. 22,68,799.52), රුපියල් දොලොස් ලක්ෂ හාරසියපනහයි ශත අසූ අට (රු. 12,00,450.88) සහ රුපියල් තුන් ලක්ෂ පනස් හය දහස් හාර සිය අසූතුනයි ශත හතලිස් පහක (රු. 3,56,483.45) මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්.රාමනායක විසින් එකී අංක 123, 1692 සහ 6251 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.”.

### දේපල පිළිබඳ විස්තර

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අටිකාරි පත්තුවේ, ඉහල බියන්විල, පිහිටි ජම්බුගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් 1972.09.04 වන දින මැන සකස් කළ අංක 1547 ඒ දරන පිඹුරේ ලොට් අංක 16 දරන කොටසට මායිම් - උතුරට : මෙම ඉඩමේ ලොට් 14 සහ 15 ද, නැගෙනහිරට : කේ. එච්. විල්මන් සහ එස්. ඩී. ගුණරත්නට සහ තවත් අයට අයත් ඉඩම සහ ලොට් 19 ද, දකුණට: ලොට් 19, ලොට් බී සහ ලොට් 18 ද, බස්නාහිරට : ලොට් 17 සහ 18 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 20.5) විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 444/168 හි ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී ඉහල බියන්විල පිහිටි ජම්බුගහවත්ත නමැති ඉඩමට සකස් කළ අංක 1547ඒ දරන පිඹුරේ ලොට් අංක 18 දරන කොටසට මායිම් - උතුරට : ලොට් 17 සහ 16 ද, නැගෙනහිරට : ලොට් 16 සහ ලොට් බී ද, දකුණට : ලොට් බී සහ ලොට් සී ද, බස්නාහිරට : ලොට් සී සහ ලොට් 17 ද යන මායිම් තුල පිහිටි පර්චස් දහඅටයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 18.5) විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදි සියලු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 444/169හි ලියාපදිංචි කර ඇත.

3. ඉහත කී ඉහල බියන්විල පිහිටි ජම්බුගහවත්ත නමැති ඉඩමට සකස් කළ අංක 1547 ඒ දරන පිඹුරේ ලොට් අංක 17 දරන කොටසට මායිම් - උතුරට : ලොට් 14 සහ 16 ද, නැගෙනහිරට : ලොට් 16 සහ ලොට් 18 ද, දකුණට : ලොට් 18 ද, බස්නාහිරට : ලොට් සී ද යන මායිම් තුල පිහිටි පර්චස් දහ අටක (අ. 0, රූ. 0, පර්. 18) විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදි සියලු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 438/83 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී පිඹුරු අංක 1547 ඒ හි සඳහන් ලොට් බී සහ ලොට් සී හි මාර්ග අයිතිය ද සමග වේ. මේවා පිළිවෙලින් ගම්ගහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 444/167 සහ සී 438/275 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
බටහිර කලාප III,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

11-144

---

## රාජ්‍ය උකස් හා අයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා අයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුනු යෝජනාව

ණය අංකය : 6/33623/පී6/372.

රාජ්‍ය උකස් හා අයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.03.09 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :-

1. කලුතර ප්‍රසිද්ධ නොතාරිස් එම්. ෆ්. එෆ්. කුරේ විසින් සහතික කරන ලද 1998.04.18 දින හා අංක 6361 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම කලුතර පදිංචි පිලිප්පු මණ්ඩාඩිගේ ඇන්ටනි ෂර්වින් තිසේරා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.02.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ හත්දහස් පන්සිය හැට අටයි ශත හැටහතරක (රු. 1,07,568.64) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 6361 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් තිස් නවයයි ශත හතලිස් හතර (රු. 39.44) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, වාද්දුව, තල්පිටිය උතුරු මැද පාර, අංක 40 හි බලයලත් වෙන්දේසිකාර ඩී. පී. එල්. සී. ද සිල්වා මහතාට බලය පැවරිය යුතු වන්නේය.".

### උපලේඛනය

කලුතර දිස්ත්‍රික්කයේ, කලුතර තොටමුණේ කලුතර බැද්ද කලමුල්ල පිහිටි වෙල්ලබඩවත්තේ කැබලි අංක 4 සහ 5 හි කැබලි අංක 2 *නොහොත්* වෙල්ලබඩ මහ වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ජී. සී. සිරිසෝම විසින් 1997.03.03 දින මැන සකසන ලද අංක 1546 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 2 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 12.20 ක්වූ බෙදා වෙන්කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

තව ද, එකී අංක 1546 දරන පිඹුරේ කැබලි අංක 6, 4 සහ 5 මතින් දැක්වෙන මාර්ග අයිතීන් ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006ක් වූ ඔක්තෝබර් මස 20 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

11-153/6

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත ඩිපිටපතඩ් කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :-

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 1,008 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනයකම ධිශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයබ් පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික)

| | මෙරට රු. ශ. | පිටරට රු. ශ. |
|---|---|---|
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 0 | 2,098 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 0 | 745 0 |
| I වන ඡේදය | 520 0 | 1,007 0 |
| II වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 0 | 1,009 0 |
| III වන ඡේදය | 468 0 | 907 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 0 | 4,422 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිළ රු. ශ. | තැපැල් ගාස්තුව (මෙරට) රු. ශ. |
|---|---|---|---|
| (අ) | I වන කොටස | 31 0 | 5 0 |
| | II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 0 | 5 0 |
| (ආ) | I වන ඡේදය | 10 0 | 5 0 |
| | II වන ඡේදය | 12 0 | 5 0 |
| | III වන ඡේදය | 9 0 | 5 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

*සැලකිය යුතුයි.*- මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළකිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2006** | | | |
| නොවැම්බර් | 2006.11.03 | සිකුරාදා | 2006.10.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.11.10 | සිකුරාදා | 2006.10.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.11.17 | සිකුරාදා | 2006.11.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.11.24 | සිකුරාදා | 2006.11.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| දෙසැම්බර් | 2006.12.01 | සිකුරාදා | 2006.11.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.12.08 | සිකුරාදා | 2006.11.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.12.15 | සිකුරාදා | 2006.12.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.12.22 | සිකුරාදා | 2006.12.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.12.29 | සිකුරාදා | 2006.12.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2007** | | | |
| ජනවාරි | 2007.01.05 | සිකුරාදා | 2006.12.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.01.12 | සිකුරාදා | 2006.12.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.01.19 | සිකුරාදා | 2007.01.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.01.26 | සිකුරාදා | 2007.01.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.